# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1641/44 - 2010 පෙබරවාරි 18 වැනි බ්‍රහස්පතින්දා - 2010.02.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත**

3 වැනි වගන්තිය යටතේ නියමය

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ තුන් වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍ය දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන වන මම, මෙහි උපලේඛනයේ I වැනි තීරුවේ නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, එම උපලේඛනයෙහි II වැනි තීරුවෙහි සටහනේ සඳහන් ඉම් හා මායිම් සලකුණු නිශ්චිතව දක්වා ඇත්තා වූ ද, ප්‍රදේශය සංවර්ධනය කිරීම සඳහා සුදුසු බැව් මාගේ මතය වන හෙයින් ඒ ප්‍රදේශය ඒ වගන්තියේ කාර්ය සඳහා නාගරික සංවර්ධන ප්‍රදේශයක් විය යුතු යැයි මෙම නියමයෙන් ප්‍රකාශ කරමි.

දිනේෂ් චන්ද්‍ර රූපසිංහ ගුණවර්ධන,
නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍ය.

2010 පෙබරවාරි මස 5 වැනි දින,
බත්තරමුල්ල,
නාගරික සංවර්ධන හා පූජා භූමි සංවර්ධන අමාත්‍යංශයේ දී ය.

*උපලේඛනය*

*මාලිගාතැන්න නාගරික සංවර්ධන ප්‍රදේශය*

*I වන තීරුව*

ඌව පළාතේ, බදුල්ල දිස්ත්‍රික්කයේ, හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හා හාලිඇල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල පිහිටි ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක 57ඒ පෙරහෙට්ටිය (කොටසක්) ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක 57බී වැපැස්සාවෙල, (කොටසක්) ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක 57එච් මාලිගාතැන්න, (කොටසක්) ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක 55ඊ, හින්නාරන්ගොල්ල (කොටසක්) යන ග්‍රාම නිලධාරි කොට්ඨාස තුල පිහිටි මෙහි II වැනි තීරුවෙහි ඉම හා මායිම් ඇතුළත් මුළු මහත් භූමි ප්‍රදේශය.

*II වන තීරුව*

*උතුරට* : බණ්ඩාරවෙල ඇටැම්පිටිය ප්‍රධාන මාර්ගයේ මධ්‍ය රේඛාව හා ඌව හයිලන්ඩ්ස් වත්තේ අඩිපාරේ මධ්‍ය රේඛාව හමුවන ස්ථානයේ සිට ඊසාන දෙසින් මීටර් 80ක් දුරින් ඌව හයිලන්ඩ් වත්තේ අඩිපාරේ මධ්‍ය රේඛාව මත පිහිටි ලක්ෂයක සිට හාලිඇල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 17 අවසාන ගම් පිඹුරේ අංක 16 ඉඩමේ උතුරු මායිම ඔස්සේ ඌව හයිලන්ඩ්ස් වත්තේ අලුත් කොටස වතු සේවා මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක් ඊසාන දෙසට අඳින ලද රේඛාව, එතැන් සිට අංක 37 ඉඩම්

*උපලේඛනය (සම්බන්ධිතයි)*

| *I වැනි තීරුව* | *II වැනි තීරුව* |
|---|---|
| | කොටසේ උතුරු ලක්ෂය හමුවන තෙක් ගිණිකොන දෙසට අදින ලද ඍජු රේඛාව එතැන් සිට අංක 37 ඉඩම් කොටසේ නැගෙනහිර මායිම ඔස්සේ අංක 38 උතුරු මායිම හමුවන තෙක් ගිණිකොන දෙසට අදින ලද රේඛාව, එතැන් සිට අංක 38 ඉඩමේ කොටසේ උතුරු මායිම ඔස්සේ එම ඉඩමේ නැගෙනහිර මායිම හමුවන තෙක් ඊසාන දෙසට හා ගිණිකොන දෙසට අදින ලද රේඛාව, එතැන් සිට අංක 38 ඉඩම් කොටසේ නැගෙනහිර මායිම ඔස්සේ අංක 40 ඉඩම් කොටසේ උතුරු මායිම හමුවන තෙක් ගිණිකොන දෙපැත්තට අදික ලද රේඛාව, එතැන් සිට අංක 40 ඉඩම කොටසේ උතුරු මායිම ඔස්සේ එම අංක 40 ඉඩම් කොටසේ නැගෙනහිර මායිම හමුවන තෙක් ඊසාන දෙසට හා ගිණිකොන දෙසට අදින ලද රේඛාව, |
| නැගෙනහිරට : | අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට එකී අවසාන ගම් පිඹුරේ අංක 40 දරන ඉඩම් කොටසේ නැගෙනහිර හා දකුණු මායිම් ඔස්සේ අංක 44 ඉඩම් කොටසේ නැගෙනහිර මායිම ආරම්භක ස්ථානය දක්වා නිරිත දෙසට අදින ලද රේඛාව, එතැන් සිට එකී අංක 44 ඉඩම් කොටසේ නැගෙනහිර මායිම ඔස්සේ අංක 9 ඉඩම් කොටසේ උතුරු මායිම හමුවන තෙක් ගිණිකොන දෙසට අදින ලද රේඛාව, එතැන් සිට එකී අංක 9 ඉඩමේ උතුරු මායිම ඔස්සේ අංක 48 ඉඩම් කොටසේ උතුරු හා නැගෙනහිර මායිම් හමුවන ලක්ෂය දක්වා නැගෙනහිර දෙසට, ගිණිකොන දෙසට, දකුණු දෙසට, නිරිත දෙසට හා බටහිර දෙසට අදින ලද රේඛාව, එතැන් සිට එකී අංක 48 ඉඩමේ නැගෙනහිර මායිම ඔස්සේ කිරින්ද අරාව කඳුර මධ්‍ය රේඛාව හමුවන තෙක් ගිණිකොන දෙසට, දකුණු දෙසට, ගිණිකොන දෙසට, වයඹ දෙසට හා නිරිත දෙසට අදින ලද රේඛාව, එතැන් සිට කිරින්ද අරාව කඳුරේ මධ්‍ය රේඛාව ඔස්සේ අවසාන ගම් පිඹුර අංක 50 හි අංක 71 ඉඩම් කොටසේ උතුරු හා නැගෙනහිර මායිම හමුවන ලක්ෂය දක්වා ඊසාන දෙසට අදින ලද රේඛාව, එතැන් සිට අංක 71 ඉඩමේ නැගෙනහිර මායිම ඔස්සේ එකී පිඹුරේ අංක 63 ඉඩමේ උතුරු හා නැගෙනහිර මායිම් හමුවන ලක්ෂය දක්වා නිරිත දෙසට, ගිණිකොන දෙසට, නිරිත දෙසට, බටහිර දෙසට, නිරිත දෙසට, ගිණිකොන දෙසට හා නිරිත දෙසට අදින ලද රේඛාව, එතැන් සිට අංක 63 ඉඩමේ නැගෙනහිර මායිම් ඔස්සේ අංක 60 ඉඩමේ උතුරු හා නැගෙනහිර මායිම් හමුවන ලක්ෂය දක්වා නිරිත දෙසට අදින ලද රේඛාව, එතැන් සිට අංක 60 ඉඩමේ නැගෙනහිර මායිම් ඔස්සේ අංක 57 ඉඩමේ උතුරු හා නැගෙනහිර මායිම් හමුවන ලක්ෂය දක්වා නිරිත දෙසට අදින ලද රේඛාව, එතැන් සිට අංක 57 ඉඩමේ නැගෙනහිර මායිම ඔස්සේ එම අංක 57 |

*උපලේඛනය (සම්බන්ධිතයි)*

| *I වන තීරුව* | | *II වන තීරුව* |
|---|---|---|
| | | ඉඩමේ දකුණු මායිම හමුවන තෙක් නිරිත දෙසට අඳින ලද රේඛාව, එතැන් සිට එකී අංක 57 ඉඩමේ දකුණු මායිම ඔස්සේ අංක 138 ඉඩමේ බටහිර මායිම හමුවන තෙක් වයඹ දෙසට අඳින ලද රේඛාව, එතැන් සිට අංක 138 ඉඩමේ බටහිර මායිම ඔස්සේ එකී ඉඩමේ දකුණු මායිම හමුවන ලක්ෂය දක්වා නිරිත දෙසට හා ගිණිකොන දෙසට අඳින ලද රේඛාව, එතැන් සිට බණ්ඩාරවෙල ඇටැම්පිටිය ප්‍රධාන මාර්ගයේ පන්වැව හන්දිය මධ්‍ය ලක්ෂය පසු කරමින් අංක 55 ඉඩමේ උතුරු හා නැගෙනහිර මායිම හමුවන ලක්ෂය දක්වා නිරිත දෙසට අඳින ලද සෘජු රේඛාව, එතැන් සිට අංක 55 ඉඩමේ නැගෙනහිර මායිම ඔස්සේ අංක 51 ඉඩමේ උතුරු හා නැගෙනහිර මායිම් හමුවන ලක්ෂය දක්වා නිරිත දෙසට අඳින ලද රේඛාව, එතැන් සිට අංක 51 ඉඩමේ, නැගෙනහිර මායිම ඔස්සේ බණ්ඩාරවෙල ඇටැම්පිටිය මාර්ගයේ පන්වැව හන්දියේ මධ්‍ය ලක්ෂයේ සිට මීටර 140 ක් දුරින් නිරිත දෙසට නමක් සඳහන් නොමැති ඇලේ මධ්‍ය රේඛාව මත පිහිටි ලක්ෂය හමුවන තෙක් නිරිත දෙසට ගිණිකොන දෙසට හා නිරිත දෙසට අඳින ලද රේඛාව, |
| | *දකුණට* : | අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට එකී නමක් සඳහන් නොමැති ඇල මධ්‍ය රේඛාව ඔස්සේ මීටර් 460ක් දුරින් පිහිටි ලක්ෂය දක්වා නිරිත දෙසට, බටහිර දෙසට, දකුණු දෙසට, වයඹ දෙසට හා නිරිත දෙසට අඳින ලද රේඛාව, |
| | *බටහිරට* : | අවසන් වරට සඳහන් කරන ලද ලක්ෂයේ සිට ඌව හයිලන්ඩ් වත්තේ අංක 9 කොටස පසු කරමින් අංක 9 හන්දියේ දී පෙරහෙට්ටිය මාර්ගයේ මධ්‍ය රේඛාව හමුවන තෙක් වයඹ දෙසට අඳින ලද සෘජු රේඛාව, එතැන් සිට පෙරහෙට්ටිය මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ මුස්ලිම් පල්ලිය අසලින් ආරම්භ වන වතු සේවා මාර්ගය මධ්‍ය රේඛාව හමුවන ස්ථානය දක්වා වයඹ දෙසට, උතුරු දෙසට, හා බටහිර දෙසට අඳින ලද රේඛාව, එතැන් සිට එකී වතු සේවා මාර්ගයේ මධ්‍ය රේඛාව කන්දේකුඹුර මාරගස් හන්දිය මධ්‍ය ලක්ෂය හමුවන ස්ථානය දක්වා වයඹ හා ඊසාන දෙසට අඳින ලද රේඛාව, එතැන් සිට වතු සේවා මාර්ගයේ මධ්‍ය රේඛාව ඔස්සේ බණ්ඩාරවෙල ඇටැම්පිටිය ප්‍රධාන මාර්ගය මධ්‍ය රේඛාව හමුවන තෙක් ඊසාන දෙසට, ගිණිකොන දෙසට , ඊසාන දෙසට, උතුර දෙසට, ඊසාන දෙසට, වයඹ දෙසට, ඊසාන දෙසට, වයඹ දෙසට, ඊසාන දෙසට හා උතුරු දෙසට අඳින ලද රේඛාව එතැන් සිට බණ්ඩාරවෙල ඇටැම්පිටිය ප්‍රධාන මාර්ගය මධ්‍ය රේඛාව ඔස්සේ ඌව හයිලන්ඩ් වත්ත අඩි පාර මධ්‍ය රේඛාව හමුවන තෙක් ඊසාන දෙසට අඳින ලද රේඛාව, එතැන් සිට එකී අඩි පාර මධ්‍ය රේඛාව ඔස්සේ ආරම්භක ලක්ෂය දක්වා ඊසාන දෙසට අඳින ලද රේඛාව. |

03-158

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.